0990

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

| ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 - 10 | |
| 11 - 24 | |
| 25 - 34 | |
| 35 - 40 | |
| එකතුව | |

**2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්**

**NEW** (නව නිර්දේශය) **10 S I, II**

**(10) භූගෝල විද්‍යාව - I, II**

**2018.12.28 /12.30 - 15.40**

පැ. තුනයි

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## භූගෝල විද්‍යාව - I පත්‍රය

විභාග අංකය : ................................

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය. *(ලකුණු 01 × 40 = 40 යි)*
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා, හිස් ඉර මත ලියන්න.

1. ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල බහුලව ව්‍යාප්තව ඇති ශාක විශේෂයක් වන්නේ ................................ ය.
(කටුපඳුරු, කඩොලාන, තෘණ)

2. වෙරළ ඉම සිට නාවික සැතපුම් 12 ක් නොඉක්මවන මුහුදු මායිම ................................................ ලෙස හැඳින්වේ. (රාජ්‍ය මුහුදු සීමාව, යාබද කලාපය, අනන්‍ය ආර්ථික කලාපය)

3. දේශගුණය පාලනය කරන ස්ථානීය සාධකයක් ලෙස ........................................ දැක්විය හැකි ය.
(සාගර ප්‍රවාහ, පෘථිවි ආනතිය, භූ විෂමතාව)

4. ඉරිඟු නිෂ්පාදනය කරන ප්‍රධාන ආසියාතික රට ........................................
(ඉන්දියාවයි, පාකිස්තානයයි, චීනයයි)

5. ශ්‍රී ලංකාව වැඩි ම අපනයන ආදායමක් උපයන්නේ ........................................ කර්මාන්තයෙනි.
(පෙට්‍රෝ රසායන, ඇඟලුම්, විද්‍යුත්)

6. ........................................ භූ විද්‍යාත්මක උපද්‍රවයකි.
(භූමිකම්පා, නියඟ, කෘමි උවදුරු)

7. සුළඟේ වේගය මැනීම සඳහා ........................................ යොදා ගනී.
(වර්ෂා මාපකය, බැරෝමීටරය, අනිලමානය)

8. 1:50 000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන ........................................ සාංස්කෘතික ලක්ෂණයකි.
(වනාන්තර, වාරිමාර්ග, ගංගා)

9. භූගෝලීය තොරතුරු පද්ධතියක කිසියම් පිහිටීමක් ප්‍රකාශ කරන්නේ ........................................ දත්ත මගිනි.
(ශ්‍රේණිය, ශ්‍රේණිය නොවන, ස්ථානීය)

10. කිසියම් රටක ජනවර්ග සංයුතිය නිරූපණය කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ ........................ ප්‍රස්තාරයයි.
(තීරු, රේඛා, වෘත්ත)

[ 2 වැනි පිටුව බලන්න.

- අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශය කියවා, එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

11. කිසියම් රටක අක්ෂාංශීය පිහිටීම එම රටේ උෂ්ණත්වය තීරණය කරන ප්‍රධාන සාධකය වේ. ( නි / වැ )

12. භූතලය මත 3 km ක දුර 1:50,000 පරිමාණයේ සිතියමක දැක්වෙනුයේ 9 cm ක ප්‍රමාණයෙනි. ( නි / වැ )

13. උස් බිම් ප්‍රදේශවල කෙරෙන වී වගාව හෙල්මළු වගාව ලෙස හැඳින්වේ. ( නි / වැ )

14. කේතුධර වනාන්තර රුසියාවේ දී 'ටයිගා' නමින් හැඳින්වේ. ( නි / වැ )

15. ශ්‍රී ලංකාවේ වැඩි ම ජන ඝනත්වයක් දක්නට ලැබෙන්නේ ග්‍රාමීය ප්‍රදේශවල ය. ( නි / වැ )

- අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

16. ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 25% ට වැඩි ප්‍රමාණයක් .................................. පළාත තුළ ව්‍යාප්තව ඇත.

17. ගොවිබිම් මාරුව සහ මිශ්‍රබෝග වගාව ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ .............................. ගොවිතැන හා සම්බන්ධ ලක්ෂණ වේ.

18. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප හත අතුරින් .............................. කලාපයේ දඹුල්ල නගරය පිහිටා ඇත.

19. කහටගහ සහ කොළොංගහ .......................... ඛනිජ නිධි පිහිටි ස්ථාන දෙකකි.

20. ලෝක තෙත් බිම් සංරක්ෂණය සඳහා වසර 1971 දී ........................ සම්මුතිය ඇති කර ගන්නා ලදි.

- අංක 21 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

21. අවසාදිත පාෂාණයකට උදාහරණයක් වන්නේ මින් කවරක් ද?

    (1) ග්‍රැනයිට් (2) බැසෝල්ට් (3) වැලිගල් (4) මිනිරන් (.........)

22. ශ්‍රී ලංකාවේ දැඩි ස්වාභාවික රක්ෂිත දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

    (1) යාල හා සිංහරාජ (2) හක්ගල හා වස්ගමුව
    (3) හක්ගල හා රිටිගල (4) විල්පත්තුව හා මින්නේරිය (.........)

23. ගංගා පිටාර ගැලීමේ දී ඒ ආශ්‍රිතව රොන්මඩ තැන්පත් වීම නිසා නිර්මාණය වී ඇති පස් වර්ගය කුමක් ද?

    (1) දියළු පස (2) රතු දුඹුරු පස
    (3) පොඩ්සෝල් පස (4) ග්‍රැමුසෝල් පස (.........)

24. ප්‍රාථමික කර්මාන්ත පමණක් ඇතුළත් වන වරණය තෝරන්න.

    (1) ධීවර, යකඩ හා වානේ, ආකර කර්මාන්ත
    (2) යකඩ හා වානේ, ඉදිකිරීම්, වන කර්මාන්ත
    (3) ධීවර, ආකර, වන කර්මාන්ත
    (4) ඉදිකිරීම්, ධීවර, ආකර කර්මාන්ත (.........)

25. ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණ ආයතනය පිහිටුවා ඇත්තේ,

(1) ලුණුවිල ය. (2) අගලවත්තේ ය.

(3) තලවකැලේ ය. (4) යටියන්තොට ය. (.........)

26. උතුරු අත්ලන්තික් සාගර ප්‍රදේශයේ හමා යන සුළි සුළං හඳුන්වන නම කුමක් ද?

(1) විලි විලීස් (2) ටයිෆූන්

(3) බැගියෝ (4) හරිකේන් (.........)

27. ශ්‍රී ලංකාවේ ප්‍රථම අපනයන සැකසුම් කලාපය වනුයේ,

(1) කටුනායක ය. (2) බියගම ය.

(3) කොග්ගල ය. (4) පල්ලෙකැලේ ය. (.........)

28. ශ්‍රී ලංකාවේ සිමෙන්ති නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන ඛනිජ වර්ගය කුමක් ද?

(1) ඉල්මනයිට් (2) මිනිරන්

(3) හුනුගල් (4) කෙඔලින් (.........)

29. කාර්මික විප්ලවයේ මුල් අවධියේ දී යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය සඳහා බහුල ව භාවිත කළ අමුද්‍රව්‍ය වනුයේ,

(1) ඇලුමිනියම් ය. (2) යකඩ ය.

(3) වානේ ය. (4) තඹ ය. (.........)

30. විද්‍යුත් කර්මාන්තය ව්‍යාප්ත වී ඇති ප්‍රමුඛතම ආසියාතික රටවල් දෙක වනුයේ,

(1) චීනය හා මැලේසියාව ය. (2) චීනය හා සිංගප්පූරුව ය.

(3) චීනය හා තායිවානය ය. (4) චීනය හා ජපානය ය. (.........)

31. 1950 වර්ෂයෙන් පසුව ලෝක ජනසංඛ්‍යා වර්ධන වේගයේ කැපීපෙනෙන ලක්ෂණය වන්නේ,

(1) සංවර්ධනය වෙමින් පවතින රටවල වර්ධන වේගය පහළ අගයක් ගැනීම ය.

(2) සංවර්ධිත රටවල වර්ධන වේගය ඉහළ අගයක් ගැනීම ය.

(3) සංවර්ධනය වෙමින් පවතින රටවල වර්ධන වේගය ඉහළ අගයක් ගැනීම ය.

(4) සංවර්ධනය වෙමින් පවතින රටවල වර්ධන වේගය සෘණ අගයක් ගැනීම ය. (.........)

32. ආර්ද්‍රතාව ගණනය කරනු ලබන්නේ වායු ඒකකයක අඩංගු කුමන පදාර්ථයක් පදනම් කර ගෙන ද?

(1) දූවිලි (2) ජලවාෂ්ප

(3) ඔක්සිජන් (4) තුහින (.........)

33. ශ්‍රී ලංකාව තේ වැඩි ප්‍රමාණයක් අපනයනය කරනු ලබන්නේ,

(1) මැදපෙරදිග කලාපයට ය.

(2) යුරෝපා කලාපයට ය.

(3) අග්නිදිග ආසියානු කලාපයට ය.

(4) උතුරු ඇමරිකානු කලාපයට ය. (.........)

34. ටයිටේනියම් හා ඇලුමිනියම් වැනි අමුද්‍රව්‍ය බහුල වශයෙන් යොදා ගනු ලබන නිෂ්පාදන කර්මාන්තය කුමක් ද?

(1) මෝටර් රථ (2) ගුවන්යානා

(3) නැව් (4) ධීවරයාත්‍රා (.........)

- අංක 35 සිට 38 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.

ශ්‍රී ලංකාවේ නගරයක මාසික සාමාන්‍ය උෂ්ණත්වය හා වර්ෂාපතනය




35. මෙම නගරයේ ඉහළ උෂ්ණත්වයක් සහ අඩු ම වර්ෂාපතනයක් වාර්තා වන මාසය කුමක් ද?
    (1) ජනවාරි (2) මාර්තු (3) ජුනි (4) දෙසැම්බර් (.........)

36. වර්ෂාපතනය 100 mm ට වඩා වැඩි අගයක් ගන්නා මාස දෙකක් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) ජනවාරි සහ පෙබරවාරි (2) පෙබරවාරි සහ අගෝස්තු
    (3) සැප්තැම්බර් සහ ඔක්තෝබර් (4) ජනවාරි සහ නොවැම්බර් (.........)

37. ප්‍රස්තාරයේ දැක්වෙන තොරතුරු අනුව මෙය ශ්‍රී ලංකාවේ කුමන දේශගුණික කලාපයකට අයත් නගරයක් විය හැකි ද?
    (1) පහතරට වියළි කලාපය (2) පහතරට තෙත් කලාපය
    (3) කඳුරට තෙත් කලාපය (4) අර්ධ ශුෂ්ක කලාපය (.........)

38. මෙම නගරයට වැඩි ම වර්ෂාපතනයක් ලැබෙන්නේ කුමන වර්ෂාපතන ක්‍රමයෙන් ද?
    (1) නිරිත දිග මෝසම් සුළං (2) ඊසානදිග මෝසම් සුළං
    (3) සංවහන (4) අන්තර් මෝසම් (.........)

- අංක 39 සහ 40 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රකාශ යුගල පහ උපයෝගී කර ගන්න.

*A.* (i) අධ්‍යාපන පහසුකම් (ii) සාක්ෂරතාව

*B.* (i) උන්නතාංශය (ii) උෂ්ණත්වය

*C.* (i) උපත් අනුපාතය (ii) වියපත් ජන සංඛ්‍යාව

*D.* (i) වාහන සංඛ්‍යාව (ii) වායු දූෂණය

*E.* (i) කෘමිනාශක භාවිතය (ii) ආහාරවල ගුණාත්මක බව

39. එක් කරුණක වැඩි වීම අනෙක් කරුණෙහි වැඩි වීමට සෘජුව ම බලපාන ප්‍රකාශ යුගල දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?
    (1) *A* සහ *B* (2) *A* සහ *C* (3) *A* සහ *D* (4) *B* සහ *C* (.........)

40. එක් කරුණක වැඩි වීම අනෙක් කරුණෙහි අඩු වීමට සෘජුව ම බලපාන ප්‍රකාශ යුගල දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?
    (1) *A* සහ *D* (2) *A* සහ *E* (3) *B* සහ *C* (4) *B* සහ *E* (.........)

* *

[ 5 වැනි පිටුව බලන්න

0990

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW

2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර් | 10 | S | I, II |

(නව නිර්දේශය)

## (10) භූගෝල විද්‍යාව - I, II

## භූගෝල විද්‍යාව - II පත්‍රය

* මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.
* I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

### I කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති 1:50,000 හු ලක්ෂණ සිතියම් කොටස (ඇමුණුම 01) අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු දීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක 8) යොදා ගන්න.
අංක (i) සිට (v) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.

(i) (A) අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(අක්ෂාංශ අගයකි / දේශාංශ අගයකි / ඛණ්ඩාංක අගයකි) *(ලකුණු 01 යි)*

(ii) (B) අක්ෂරයෙන් දැක්වෙන ලක්ෂණය කුමක් ද?
(වනරක්ෂිත මායිමකි / වගුරු බිමකි / වැලිතලාවකි) *(ලකුණු 01 යි)*

(iii) (C) අක්ෂරයෙන් දැක්වෙන ලක්ෂණය කුමක් ද?
(නගර සභා සීමාවකි / සෙසු මාර්ගයකි / අඩිපාරකි) *(ලකුණු 01 යි)*

(iv) (D) අක්ෂරයෙන් දැක්වෙන ලක්ෂණය කුමක් ද?
(ග්‍රාම නිලධාරි කොට්ඨාස මායිමකි / වාරිමාර්ග ඇලකි / දුම්රිය මාර්ගයකි) *(ලකුණු 01 යි)*

(v) සිතියම් ප්‍රදේශයේ උතුරු සීමාව ආසන්නයේ ඇති B 556 මාර්ගයෙහි දුර කොපමණ ද?
(2.5 km / 04 km / 6.5 km) *(ලකුණු 01 යි)*

(vi) සිතියමේ 'අංක (1)' චතුරස්‍රය තුළ, සංකේත මගින් දක්වා ඇති රජයේ ආයතන දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(vii) සිතියම් ප්‍රදේශයේ උස ම ස්ථානයෙහි උස මීටර කීය ද? *(ලකුණු 01 යි)*

(viii) සිතියම් ප්‍රදේශය මධ්‍යයෙහි වී වගා බිම් වැඩිවීමට බලපා ඇති හේතු දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම (ඇමුණුම 02) අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සපයා ඇති විශේෂ කඩදාසියෙහි (පිටු අංක 08) අදාළ ස්ථානයේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ලියා දක්වන්න.

(i) ඩෙල්ෆ්ට් දූපත (A, B, C)
(ii) සිංහරාජ වනාන්තරය (D, E, F)
(iii) එප්පාවල පොස්පේට් නිධිය (G, H, J)
(iv) හික්කඩුව වෙරළ තීරය (K, L, M)
(v) සේනානායක සමුද්‍රය (P, Q, R)

*(ලකුණු 01 × 5 = 05 යි)*

[ 6 වැනි පිටුව බලන්න

(ඉ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියම (ඇමුණුම 03) අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර හිමි අක්ෂරය සිතියමෙන් තෝරා, සපයා ඇති විශේෂ කඩදාසියෙහි (පිටු අංක 08) අදාළ ස්ථානයේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| (i) | සහරා කාන්තාරය | (A, B, C) |
| (ii) | මහා බෙදුම් කඳුවැටිය | (D, E, F) |
| (iii) | ඇමේසන් වනාන්තරය | (G, H, J) |
| (iv) | ලන්ඩන් නගරය | (K, L, M) |
| (v) | ජපානය | (P, Q, R) |

*(ලකුණු 01 × 5 = 05 යි)*

## II කොටස

**2.** ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාපවල ව්‍යාප්තිය පහත සිතියමේ **A, B** හා **C** වශයෙන් දැක්වේ.




(අ) සිතියමේ **'B'** සහ **'C'** කලාප දෙක අනුපිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) **'A'** කලාපය නම් කර, එහි දේශගුණික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(ඉ) (i) **'A'** කලාපයේ ගංගා නිම්න ආශ්‍රිතව වගා කොට ඇති ප්‍රධාන ආහාර බෝගය නම් කරන්න.

(ii) එම බෝග වගාව ආශ්‍රිත ගැටලු දෙකක් දක්වා, ඉන් එකක් පැහැදිලි කරන්න.

*(ලකුණු 05 යි)*

**3.** (අ) ජෛවීය ස්වාභාවික සම්පත් දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) පාංශු නිර්මාණයට බලපාන සාධක තුනක් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ඉ) ශ්‍රී ලංකාවේ පාංශු සංරක්ෂණ ක්‍රමෝපායන් තුනක් දක්වා, ඉන් එකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**4.** (අ) මෝටර් රථ කර්මාන්තයේ ප්‍රමුඛ ආසියාතික රටක් සහ යුරෝපා රටක් පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) මෝටර් රථ කර්මාන්තය ස්ථානගත වීමට බලපාන සාධක තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*

(ඉ) මෝටර් රථ කර්මාන්තයේ මෑතකාලීන ප්‍රවණතා තුනක් දක්වා, ඉන් එකක් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

5. (අ) ශ්‍රී ලංකාවේ රබර් සහ පොල් වගා ආශ්‍රිත නිෂ්පාදිත ද්‍රව්‍ය දෙක බැගින් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) ශ්‍රී ලංකාවේ

(i) රබර්

(ii) පොල්

වගා කරන දිස්ත්‍රික්ක තුන බැගින් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ඉ) සුළු අපනයන බෝග වගාව, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

6. (අ) ලෝකයේ අධික ජන සංඛ්‍යාවක් ජීවත් වන රටවල් දෙක අනුපිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) ලෝකයේ ජනාධික ප්‍රදේශ ඇති වීමට බලපා ඇති හේතු තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*

(ඉ) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල අධික ජනඝනත්වය නිසා මතු ව ඇති ගැටලු දෙකක් සඳහන් කර, ඉන් එකක් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

7. (අ) පහත දී ඇති ලෝකයේ භූ තැටි මායිම් දැක්වෙන සිතියමෙහි **A** හා **B** අක්ෂරවලින් දැක්වෙන භූ තැටි දෙක පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි)*




(ආ) සුනාමි තත්ත්ව ඇති වීමට බලපාන හේතු තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*

(ඉ) ආපදා කළමනාකරණ චක්‍රයට අනුව ආපදාවට පෙර සූදානම් අවස්ථාවේ සුනාමි ආපදාවකින් සිදුවන හානි අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

8. (අ) 'පරිසර ආචාරධර්ම' යනු මොනවා දැයි හඳුන්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) පරිසරයට හානි කරන මිනිස් ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(ඉ) පරිසර ආචාරධර්ම රැකගැනීම පිළිබඳව බෞද්ධ ඉගැන්වීම් තුනක් සඳහන් කර, ඉන් එකක් උදාහරණ සහිතව විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

***

0990



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්**

**(නව නිර්දේශය)**

**(10) භූගෝල විද්‍යාව - II පත්‍රය**

II පත්‍රයේ I කොටසේ 1. (අ), (ආ) සහ (ඉ) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම කඩදාසිය යොදා ගන්න. මෙය ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

විභාග අංකය : ..............................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා පමණි.

1. (අ) (i) ..............................
(ii) ..............................
(iii) ..............................
(iv) ..............................
(v) ..............................
(vi) ..............................
..............................
(vii) ..............................
(viii) ..............................
..............................

1. (ආ) (i) ..............................
(ii) ..............................
(iii) ..............................
(iv) ..............................
(v) ..............................

1. (ඉ) (i) ..............................
(ii) ..............................
(iii) ..............................
(iv) ..............................
(v) ..............................

මුළු ලකුණු